′
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1971/10 - 2016 ජුනි මස 14 වැනි අඟහරුවාදා - 2016.06.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රේගු නිවේදන

### රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය)

101 වැනි වගන්තිය යටතේ වන නියෝගය

**මෝටර් වාහන සඳහා රේගු වටිනාකම (මිළ) නියම කිරීම**

රේගු ආඥාපනතේ (235 වැනි අධිකාරය) 101 (1) (එච්) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යටතේ වර්ගීකරණය වන ආනයනය කරනු ලබන මෝටර් වාහන සඳහා තීරු බදු සහ අනෙකුත් සියලු බදු හා ගාස්තු අයකිරීම සඳහා වටිනාකම ගණනය කිරීමේ පදනම මෙයින් නියම කරනු ලැබේ. මෙම නියෝගය 2016 ජුනි මස 14 වැනි දින සිට නැවත දන්වන තෙක් බලපැවැත්වේ.

සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 87.02, 87.03, 87.04, 87.05 සහ 87.11 යටතේ වර්ගීකරණය වන මෝටර් වාහන සඳහා රේගු වටිනාකම පහත සඳහන් අයිතමයන් (1) අ හෝ (1) ආ සහ (2), (3), (4) හා (5) හි එකතුව වන පරිදි ගණනය කළ යුතු ය.

(1)

**(අ) අළුත්ම වාහනයක් සඳහා රේගු වටිනාකම :**

අළුත්ම වාහනයක් සඳහා වූ රේගු වටිනාකම, එකී වාහනය හුවමාරුකළ වටිනාකම විය යුතු අතර, එම වටිනාකම එකී වාහනය සඳහා නිෂ්පාදකයා විසින් නිකුත් කරන ලද හෝ නිෂ්පාදකයා විසින් සහතික කරන ලද ඉන්වොයිසියක් මගින් තහවුරු කළ යුතු ය.

**(ආ) ඉහත (අ) කාණ්ඩය යටතට නොගැනෙන මෝටර් වාහනයක් සඳහා වූ රේගු වටිනාකම :**

ඉහත (අ) කාණ්ඩය යටතට නොගැනෙන මෝටර් වාහනයක් සඳහා වූ රේගු වටිනාකම, එම වාහනය අපනයනය කරන රටෙහි එම වර්ගයේම හෝ එකී වාහනයකට සෑම අතින්ම සමාන අළුත්ම වාහනයක ගනුදෙනු කළ වටිනාකමින් (දේශීය වශයෙන් අදාළ වන බදු ඇතුළත් නොවේ) 85% කට වඩා අඩු නොවිය යුතු ය.

(2) ශ්‍රී ලංකාවේ වරාය දක්වා වූ ප්‍රවාහන ගාස්තු,

(3) ශ්‍රී ලංකාවේ වරාය දක්වා වූ රක්ෂණ ගාස්තු,

(4) ශ්‍රී ලංකාවේ වරාය දක්වා ප්‍රවාහනය කිරීමට අදාළ පැටවීම, බෑම සහ මෙහෙයුම් ගාස්තු සහ

(5) ශ්‍රී ලංකාවේ වරාය දක්වා වාහනය ළඟාවන තෙක් ගැනුම්කරු විසින් දරන ලද තැරව් ගාස්තු සහ විකුණුම් කොමිස්.

අදාළ වාහනයේ ප්‍රථම ලියාපදිංචි කිරීමේ දිනය හා නැව්ගත කළ දිනය (නැව් භාර පත්‍රයේ දිනය) අතර කාල පරිච්ඡේදය වාහනය පාවිච්චි කරන ලද කාලය ලෙස ගණනය කරනු ලැබේ.

1A - G 23699 — 507 (2016/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

රේගු ආඥාපනතේ (235 වන අධිකාරය) 101(1) (එච්) වගන්තිය යටතේ වර්ෂ 2016 මැයි මස 25 දින පළ කරන ලද අංක 1968/11 දරන *ගැසට් නිවේදනය* 2016 ජුනි මස 14 වැනි දින සිට මෙයින් අවලංගු කරමි. කෙසේ වුවද, 2015 ඔක්තෝබර් මස 18 වැනි දින හෝ ඊට පෙර ප්‍රතිෂ්ඨාපනය කරන ලද සහ පසුව සංශෝධනය නොකරන ලද ණයවර ලිපිය (ලිපි) පදනම් කරගෙන ආනයනය කරන ලද මෝටර් වාහන වල රේගු වටිනාකම තීරණය කිරීම සඳහා අංක 1901/3 දරන 2015 පෙබරවාරි මස 10 වැනි දිනැති *ගැසට් නිවේදනය* අවලංගු සේ නොසලකා කටයුතු කළ යුතු වේ.

රවී කරුණානායක,
මුදල් අමාත්‍ය.

2016 ජුනි මස 14 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01.

07 - 520

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.